මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2015

Primary Piriven Year End Test - 2015

3 වසර / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

පාලි
**Pali**

කාලය : පැය තුනයි
Time: Three hours

**I කොටසේ සියලුම** ප්‍රශ්නවලට ද, **II කොටසේ 02, 03 වැනි** ප්‍රශ්න ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් තෝරාගෙන ප්‍රශ්න **05 කට පමණක්** පිළිතුරු සපයන්න.

**I කොටස**

01. **කෙටි පිළිතුරු සපයන්න.**

i. සමාස වර්ග 04 ක් නම් කරන්න.
ii. කච්චායන ධාතුමඤ්ජූසාවේ කතුවරයා කවු ද?
iii. තද්ධිත ප්‍රභේද කීය ද? එයින් 03 ක් නම් කරන්න.
iv. **'මුඛ + චන්‍ද > මුඛචන්‍ද'** යනු කුමන පදයක්දැයි දක්වන්න.
v. **'මනුස්සස්ස'** යන පදය යොදා වාක්‍යයක් නිර්මාණය කරන්න.
vi. ධාතුවකට පසුව ප්‍රත්‍යයක් එකතු වී සෑදෙන්නේ කුමන නාම ද?
vii. රසවාහිනි කෘතියෙන් ඔබ උගත් කථා වස්තු 04 ක නම් ලියන්න.
viii. **'උපවග්ගා ඔට්ඨජා'** යන සූත්‍රයෙන් කියවෙන අක්ෂර ලියා දක්වන්න.
ix. ධම්ම පදය බුද්දක නිකායෙහි කීවෙනි ග්‍රන්ථය ද? එහි වග්ග ගණන කීය ද?
x. **ලොක + අග්ගො** යන පද දෙක බාලාවතාර සූත්‍රානුසාරයෙන් සන්ධි කර දක්වන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

**II කොටස**

02. **(අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.**

අනුරාධනගරෙ එකො තාලරුක්ඛො අහොසි. සො කිර ඵලවන්තො රුක්ඛො. ඉතොචිතො සංචරන්තා කුමාරා තං අද්දක්ඛිංසු. තෙ තානි ඵලානි ඔචිනිතුං චින්තයිංසු. අථ තෙහි එකො කුමාරො රුක්ඛං ආරොපිතො.

*(ලකුණු 05 යි)*

**(ආ) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.**

i. තෙ සීතං උදකං පිවන්ති.
ii. ද්වෙ ඵලානි රුක්ඛතො පතන්ති.
iii. ගච්ඡන්තෙසු ධාවන්තො ජිනාති.
iv. රාජා එකාදසමං රට්ඨං ගණ්හි.
v. සො මහන්තෙන ඔසෙන වුය්හමානො මහා විරවං විරවි.

*(ලකුණු 05 යි)*

**(ඉ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.**

i. ගොවියෝ එක් දිනකින් ම කුඹුර සාති.
ii. සිවලා ඌ මතට පැන්නේ ය.
iii. පින්වත ඔබ කවු ද?
iv. මෙය රහසින් ඒ වනිතාවට දෙව.
v. පෙර එක් ගැහැණියක් එක් එළු දෙනකගේ හිස සින්දාය.

*(ලකුණු 05 යි)*

**(අ.පි.බ)**

03. **(අ) පහත සඳහන් ඡේදය සිංහලයට නගන්න.**

තතො අරුණෙ උග්ගතෙ මනුස්සානං ගතකාලෙ ථෙරො සප්පො මයා ගහිතොති සප්පං දස්සෙසි. කතරවෙලාය තෙ සප්පො ගහිතොති භික්ඛූහි පුට්ඨො නිදානකථාය ආරම්භකාලෙයෙවාති ආහ. භික්ඛු අච්ඡරියම්භන්තෙ අබ්භුතං තයාකතං ඊදිසෙන ඝොරාසිවිසෙන සප්පෙන දට්ඨෙනාපිවිසවෙගෙන අනක්ඛිත්තෙන හුත්වා ධම්මං සුණමානෙනාති ආහංසු. තතො සො ආවුසො, විසං මෙ සාවසෙසං, තං සච්චකිරියානුභාවෙන හනිස්සාමීති සච්චකිරියං කරොන්තො එවමාහ.

(ලකුණු 10 යි)

(ආ) කුඩ්ඩරජ්ජවාසී තෙරුන්ගේ කථාවෙන් හෙළිවන ධර්මශ්‍රවණානිශංස අගය කරන්න.

(ලකුණු 05 යි)

04. (අ) සන්ධි කාර්‍යයන් 05 ක් නම් කරන්න.

(ලකුණු 05 යි)

(ආ) පහත විසන්ධි පද සන්ධි වන ආකාරය දක්වන්න.

i. බන්ධුස්ස + ඉව ii. තීනි + ඉමානි

(ලකුණු 05 යි)

(ඉ) පහත දැක්වෙන උද්ධෘත පාඨ එකකින් එක බැගින් වන සේ **සන්ධි පද 05 ක්** තෝරා ලියන්න.

i. එතං මංගලමුත්තමං.
ii. යානීධ භූතානි සමාගතානි.
iii. අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො.
iv. තීනිමානි භික්ඛවෙ පණ්ඩිතස්ස පණ්ඩිතලක්ඛණානි.
v. භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං.

(ලකුණු 05 යි)

05. (අ) අකාරාන්ත පුල්ලිංග **'ගච්ඡන්ත'** ශබ්දය **හෝ** ඉකාරාන්ත පුල්ලිංග **'මුනි'** ශබ්දය සියලු විභක්තිවල වරනගා වගුගතකර දක්වන්න.

(ලකුණු 10 යි)

(ආ) **ගමු** හෝ **වච** ධාතුවලින් එකක් පඤ්චමී හෝ භීයත්තනී ආඛ්‍යාතයේ පරස්සපදයේ වරනගා වගුගතකර දක්වන්න.

(ලකුණු 05 යි)

06. (අ) කාල වශයෙන් කෘදන්ත ප්‍රභේද නම් කරන්න.

(ලකුණු 03 යි)

(ආ) තප්පුරිස සමාසයේ ප්‍රභේද 06 ක් නම් කරන්න.

(ලකුණු 06 යි)

(ඉ) අපච්චත්ථ තද්ධිතයට අදාළ ප්‍රත්‍යය 06 ක් නම් කරන්න.

(ලකුණු 06 යි)

07. **(අ) පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.**

i. න භජෙ පාපකෙ මිත්තෙ......
ii. සන්තං තස්ස මනං හොති......
iii. යො සහස්සං සහස්සෙන......

(ලකුණු 03 × 03 = 09 යි)

(ආ) අවම වශයෙන් නිදසුන් 02 ක් වත් දක්වමින් සාර්ථක ජීවිතයකට පණ්ඩිත වග්ගයෙන් ගත හැකි උපදේශ සාකච්ඡා කරන්න.

(ලකුණු 06 යි)

***